## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

**ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

## பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் .492

**நிறுவனத்தின் பெயர் - மாவட்டச் செயலகம், யாழ்ப்பாணம்**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்ட நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

## Parliamentary Series No. 492

**Name of the Institution - District Secretariat, Jaffna**

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

**ස්ථාවර නයෝග 119(4) යටතේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර.**

**පාර්ලිමේන්තු මාලා අංක - 492**

**ආයතනයේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය**

<table>
<tr><th>අනු අං</th><th>ගිණුම් පිළිබඳ කමිටුව මගින් හඳුනාගත් අඩුපාඩු</th><th>හඳුනාගත් අඩුපාඩු විසඳීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය</th></tr>
<tr><td>01</td><td>අභ්‍යන්තර විගණන විමසීම් සඳහා මාසයක් ඇතුළත ප්‍රතිචාර ඉදිරිපත් කර නොතිබුණි.</td><td>වර්තමානයේ, කිසිදු ප්‍රමාදයකින් තොරව නියමිත කාලය තුළ ප්‍රතිචාර සපයනු ලැබේ.</td></tr>
<tr><td>02</td><td>සංවර්ධන නිලධාරීන් ලෙස අනුයුක්ත කර ඇති නිලධාරීන් හැර, අනුමත කර ඇති උපරිම සීමාව ඉක්මවා යන ආකාරයකින් සේවකයින් සංඛ්‍යාව ඒකාබද්ධ කර හෝ බඳවා ගෙන ඇත.</td><td><table><tr><th></th><th>නිලධාරීන්ගේ වර්ගය</th><th>අතිරික්තය</th></tr><tr><td>1</td><td>ජ්‍යෙෂ්ඨ මට්ටම</td><td>-</td></tr><tr><td>2</td><td>තෘතියමට්ටම</td><td>02</td></tr><tr><td>3</td><td>ද්විතියිකමට්ටම</td><td>-</td></tr><tr><td>4</td><td>ප්‍රාථමිකමට්ටම</td><td>04</td></tr><tr><td></td><td>එකතුව</td><td>06</td></tr></table>තෘතියමට්ටමේ අතිරික්ත තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙකුගේ විස්තර ඇමුණුම II හි මිස්කෝ හි (Misco) උඩුගත කර ඇත.<br>ප්‍රාථමිකමට්ටමේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2016 සිට අනුමත කරන ලද කාර්ය මණ්ඩලයේ ඇතුළත් කර, ඔවුන් සේවයේ රැඳී සිටින කාලය දක්වා (Personal to holder) ඔවුන්ට අවසර ලැබේ. ඒ අනුව, ප්‍රාථමික මට්ටමේ ඇති අතිරේක කාර්ය මණ්ඩලය (Personal to holder) කාර්යාල කාර්ය මණ්ඩල සේවා කාර්ය මණ්ඩලය වෙත අන්තර්ග්‍රහණය කිරීම සඳහා, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි නියැදි සේවා සටහනක් සකස් කර යවා ඇති අතර, ඒ සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.</td></tr>
</table>

| | | |
|---|---|---|
| 03 | දිස්ත්‍රික් මිලකරණ කමිටු රැස්වීම් මාසිකව පවත්වනු නොලැබේ. | 2023 දී ඉදිකිරීම් මිල ගණන්වල කිසිදු වෙනසක් සහ ස්ථාවරත්වයක් නොතිබූ බැවින්, රැස්වීම 2023.01.17 සහ 2023.06.20 යන දිනවල රැස්වීම් දෙකක් පවත්වන ලදී. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2025.09.01 දිනැති අංක 03/2025 දරන චක්‍රලේඛයට අනුව, වත්මන් වසරේ දිස්ත්‍රික් මිලකරණ කමිටු රැස්වීම් පළමු මාසයේ පවත්වන ලදී. |
| 04 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය සුදුසුකම් ලත් / අවසරය ප්‍රතික්ෂේප කිරීම / අහිතකර මට්ටමක පැවතුනි. | විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලද බොහෝ නිරීක්ෂණ නිවැරදි කර ඇති අතර අනෙකුත් නිරීක්ෂණ නිවැරදි කිරීමට අඛණ්ඩ පියවර ගනිමින් පවතීය. |
| 05 | විගණකාධිපතිවරයාගේ වාර්තාවල නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත. | විගණකාධිපතිවරයාගේ නිර්දේශවලින් 80%ක් වඩා වැඩි ක්‍රියාත්මක කර ඇති අතර ඉතිරි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අඛණ්ඩ පියවර ගනිමින් පවතීය. |
| 06 | උපරිම සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරීන් නිසි ලෙස ස්ථාන මාරු කර නොමැත. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අදාල නිලධාරීන් සඳහා වන ස්ථාන මාරුවීම දිසාපතිවරයා විසින් වරින් වර සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, වෙනත් අමාත්‍යාංශවලට ඇති වසර 5 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් අදාළ අමාත්‍යාංශ විසින් සිදු කිරීමට කටයුතු කල යුතු අතර අදාල විස්තර අපි විසින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යවන ලදී. |

එස්. කිරුබාහරන්,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
යාපනය.

S.Kirupakaran
Chief Accountant
For Goverment Agent/ District Secretary
District Secretariat,
Jaffna

එම්. පිරතීබන්,
දිස්ත්‍රික් ලේකම්,
යාපනය දිස්ත්‍රික්කය,

M.Piiratheepan
Government Agent/District Secretary
Jaffna District

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය